# පුංචි මගේ කවි



Y.M.P.G. සනිකා මේධාවි යාපා බණ්ඩාර

කතෘ අයිතිය
කෘතියේ නම : පුංචි මගේ කවි
ශ්‍රේණිය : 6
කතෘගේ නම : Y.M.P.G.සතිකා මේධාවි යාපා බණ්ඩාර
චිත්‍ර : Y.M.P.G. සතිකා මේධාවි යාපා බණ්ඩාර

ප්‍රකාශිත දිනය : 2025-02-08
කතෘගේ වෙනත් කෘති
ප්‍රථම මුද්‍රණය: අඩම්බර සමනලයා 2021
ප්‍රථම මුද්‍රණය: කපුටුභාමිට ප්‍රශ්නයක් 2023

ISBN 978-624-208-279-0

# පිදුම

ගුණ නැණ පහදා දෙමින්
නිරන්තරයෙන් අපට ශක්තියක් වූ
අපගේ පාසලේ විදුහල්පතිතුමියටත්,
ආදරණීය ගුරු මණ්ඩලයටත්,
පාසලේ සහෝදරියන්ටත්
ඉතා ගෞරවයෙන් මෙම කෘතිය පුද කර
සිටිමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# සමනලයා

සියුමැලි
අත්තටු පරිස්සම්
කරගෙන
පියාඹා යන
පුංචි ඔබට
ආදරෙන්
ලියමි
කවියක්,




දේ දුන්නේ පාට අරන්
මල් පෙත්තේ සියුමැලිද අරන්
කලබලයෙන් වාගේ යන්නේ
කොහොද පුංචි සමනලයෝ

මල් තිබුණට පාට පාට
නෑ ලස්සන ඔයා වගේ
පැණි බොන්නට ආව ඔයා
මට පෙනුනෙත් මලක් වගේ

# ගංගාවේ

කඳු අතරින් ගලා බසින
සීත ගඟුල් දිය දහරා
ගල් පර වල හැප්පිලා
ගලා බසී හිනැහිලා

බලන් ඉන්න ආස හිතෙන
නිල් පාටින් ගලා බසින
මේ ගං ඉවුරේ නවතින්නට
ආස හිතෙයි හැම තිස්සෙම



සොබාදහම
හරි පුදුමයි
මැවුණු මේ ගංගාවෝ
විටක නිහඬයි
විටක ප්‍රචණ්ඩයි
මේ ගංගාවෝ,
දෙවියන්ගේ ආනුභවයෙන්
රැකදේවා !

# මගේ රට

මං ඉපදුණු හැදුණු වැඩුණු
මේ පොළොවේ තැනක් ඇතේ
පිම්බර දේශයකි උතුම්
සිරිලක් අම්මා මාගේ



සිත සුළං දිය දහරා වනපෙත්
අඩුවක් නම් ඇත්තේ නැතේ
මුතු මැණිකක් වගේ රකිමු
මේ සිරි ලක් අම්මා මගේ

# බෝනික්කා




ඈත රටක
ඉඳලා ආව
අම්මා අරන්
ගෙදර ආව
පුංචි මගේ
උපන් දිනේ
මට ලැබුණේ
හොඳම තෑගි

සුදු නංගිගේ මූණ වගේ
හරි ලස්සන සිනා මැවූ
සුරංගනක් ද කියා සිතේ
මගේ ලස්සන බෝනික්කා

රතු පාටින් කම්බුල් දෙක
නිල් පාටින් දිලෙනවා ඇස්
රෝස මලක් වගේ දෙතොල්
මගේ ලස්සන බෝනික්කා

# වැස්ස



කළු පාටින් වළාකුලක් ඈත අහසේ පාවෙලා
සුළං පාර හරිම සැරට මතු වෙලා
වැහි ලිහිණියෝ ඈත අහසේ පියඹලා
හිමින් සැරේ වැස්ස එන්න සැරසිලා

රෙදි ටික ගෙට ගන්න දුවේ
අම්මා හනිකට කෑ ගැසුවේ
විදුලි කොටන සද්දෙත් ඇසුණේ
සැරටම වැස්සක් වැටුණේ

# හඳ මාමා



රෑ අහසේ තනි මකන්න
හෙමිහිට අහසට නගින්න
බලන් වුණොම් අපි හැමෝම
පුන් සඳ පායන හැටි බලන්න

දහසක් තරු මැද සිටිනා
තරුවෙ එළිය වැඩි කෙරුවා
ලොවටම එළියක් පුදලා
අහිංසකව සිනාසුණා

හඳ මාමගේ සිනා හඬින්
මුළු ලෝකෙම එළිය වුණා
දැන්නම් මට තනි නෑනේ
හඳ මාමා ඉන්න නිසා

# මගේ අම්මා

ලේ කිරි කර මට පෙව්වා
මගේ කැත කුණු අත ගෑවා
ආදරයෙන් මං හැදුවා
මගේ ආදර සුදු අම්මා



මං දඟ වැඩ කරම
තරහා අරන් ආවට
ගුතටි දෙකකුත් දුන්නට
තරහක් නෑ ඇගේ හිතේ

ජීවිතේ මට කියා දෙමින්
ගුරු හුරු කම් මට දුන්නා
වැටිල අඩපු හැම පාරම
ලඟම ඉදලා සැනසුවා
සීමාවක් නැති ඔබේ ආදරේ
මට ඉන්නේ ඔබ විතරනේ

# මගේ පුංචි බලු

උදේ ඉඳලා රෑ වෙනකල්
බව් බව් බව්
දැන් නම් මගෙ කනත් රිදෙයි
බව් බව් බව්

සුදු පාටින් බෝලේ වගේ
පුළුන් බෝලයකුත් වගේ
ඇස් දෙක පිල් බෝල වගේ
කන් දෙක ඒරියල් වගේ

ඉඳලා හිටලා දඟ කරාට
හොර වැඩ දෙක තුන කරාට
මට ආදරේ හොඳම මිතුරා
මං ආදරේ හිත පුරවලා



# හා හාමි

උඳු පියලි ගොල්ල උඩින්
පැන පැන යන හා හාමි
සුදුම සුදුයි බෝලෙ වගේ
පැන පැන යන හා හාමි





කැරට් කන්න හරි කැමතියි
නිදා ගන්න හරි කැමතියි
පැන යන්නත් හරි කැමතියි
හා හාමිට අපි කැමතියි

හා පැංචට මං ආදරෙයි



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්